# මයිකල් ආර්. පොම්පෙඕ ලේකම්තුමා සමග රූපවාහිනී නාලිකාවේ ප්‍රසාද් දොඩම්ගොඩගේ පැවැත්වූ සාකච්ඡාව

2020 ඔක්තෝබර් 28

**ප්‍රශ්නය:** පොම්පෙඕ ලේකම්තුමනි, ජාතික රූපවාහිනි (*නොපැහැදිලි ය*) වෙනුවෙන්, අපට මේ අගනා අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුති කරන්නට මා කැමතියි, ඒ වාගෙම, ඔබතුමා සමගින් මේ වැදගත් සංවාදයේ නිරතවන්නට ලැබීම අපට ඉමහත් සතුටක් වාගේම ගෞරවයක් වනවා.

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔබ සමගින් සම්බන්ධවීම සතුටක්. කොළඹ නගරයට පැමිණීමට ලැබීම වැදගත්. මේ දක්වා මගේ චාරිකාව ඉතාමත් විශිෂ්ට ලෙස සිදුවුනා.

**ප්‍රශ්නය:** පොම්පෙඕ ලේකම්තුමනි, ඔබතුමාගේ මේ ශ්‍රී ලංකා සංචාරය විවිධාකාරයෙන් ශීර්ෂපාඨ මැවීමට හේතු වී තිබෙනවා. මුලින්ම, මෙය සිදුවන්නේ එක්සත් ජනපද ජනාධිපතිවරණය පැවැත්වීමට ඉතා ආසන්නයේ. මීළඟට, රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කළ ප්‍රකාශයකුත් තිබුණා. එනිසා, මේ සංචාරය සම්බන්ධයෙන් අනුමාන කළ විවිධ නිර්වචන තිබෙනවා. ඉතින්, මේ සංචාරය සම්බන්ධයෙන් ඔබතුමාගේ නිර්වචනය කුමක්ද?

**පොම්පෙඕ ලේකම්තුමා:** මා මෙම කලාපයට බොහෝ අවස්ථාවල සංචාරය කර තිබෙනවා. මෙය එක්සත් ජනපදයට වැදගත් කලාපයක්. ලෝකය මුළුල්ලේ ප්‍රජාතන්ත්‍රවාදී මිත්‍රත්වයන් අප අගය කරනවා. මීට කලින් මෙහි ඒමටයි මගේ බලාපොරොත්තුව තිබුණේ, කලින් මෙය නියම කරගෙන තිබුණත් එය අවලංගු කරන්නට සිදුවුනා, නමුත් අද දිනයේ මෙහි පැමිණෙන්නට හැකිවීම පිළිබඳ මා සතුටු වනවා. ඒ වාගේම මාගේ බලාපොරොත්තු සුන්වී ගියේ නැහැ. රාජපක්ෂ ජනාධිපතිතුමා සමගින් සහ විදේශ අමාත්‍යතුමා සමගින් මා පැවැත්වූ රැස්වීම් ඉතා විශිෂ්ටයි.

ශ්‍රී ලංකාවේ ජනතාවත් එක්සත් ජනපදයේ ජනතාවත් අතරේ පොදු දැක්මක්, එනම්, නිදහස් වෙළඳාමක් හා සාධාරණ වෙළඳාමක් අවශ්‍ය කරන, නිදහස් හා විවෘත ඉන්දියානු සාගරයක් හා ඉන්දු-ශාන්තිකර කලාපයක් අවශ්‍ය කරන, අපගේ පවුල්වලට වඩාත් හොඳ ජීවිතයක් ලබාදීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයන් සමගින් එක්ව වැඩ කරන, පොදු දැක්මක් ඇති බව ඔබට පෙනෙනවා ඇති. පැමිණ, අපගේ අගනා හවුල්කරුවන් සමගින් එක්වී වැඩ කරන්නට එක්සත් ජනපදය වඩාත් ප්‍රිය කරන්නේත් මේ කාරණා සම්බන්ධයෙන්මයි, අද දිනයේදී ඒ අරමුණ තවදුරටත් ඉදිරියට ගෙනයන්නට හැකිවූවා යැයි මට ඉතා හොඳ විශ්වාසයක් තිබෙනවා.

**ප්‍රශ්නය:** අත්‍යාවශ්‍ය ආර්ථික ප්‍රතිලාභ සහිතව නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් සඳහා ට්‍රම්ප් පරිපාලනයේ ඇති ප්‍රතිපත්තිය පිළිබඳව ඔබතුමා සඳහන් කළා. ඉතින්, ආරක්ෂාව ද (නොපැහැදිලි ය) එහි කොටසක් වනවා, එසේනම්, පොදුවේ මේ සමස්ථ ප්‍රතිපත්තිය තුළ ශ්‍රී ලංකාවට තිබෙන තැන කුමක්ද? ඉන් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලැබෙන්නේ කෙසේද?

**පොම්පෙඕ ලේකම්තුමා:** එක් අතකින්, ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ වැදගත් නෞකා මාර්ගයක් මත. ඒ වාගේම, කෘෂිකාර්මික නිෂ්පාදන, ඇඟළුම් නිෂ්පාදන අපනයනය සඳහා ශ්‍රී ලංකාවට විශාල හැකියාවක් තිබෙනවා. වෙළඳාමේ නිරතවීමට හැකියාව තිබෙන කල, සාධාරණ නීති මාලාවක් තිබිය යුතු ය යන්න හා රටවල් මත සැබෑ බරක් පටවන විලෝපික ස්වභාවයේ ණය පිළිගත යුතු නොවන බව සියළුදෙනාම තේරුම්ගත් කල ශ්‍රී ලංකාව ඉන් බොහෝ ප්‍රතිලාභ ලබාවි. නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකරයක් සම්බන්ධයෙන් එක්සත් ජනපදය සිතනපතන ආකාරය, එවැනි දේවලට ප්‍රතිවිරුද්ධයි.

එනිසා, මා ජපානයට හෝ දකුණු කොරියාවට සංචාරය කළත්- අද මෙහි සිට මා ඉන්දුනීසියාවටත් මාලදිවයින්වලටත් පිටත්වනවා- මේ එක් එක් රට, තමන්ගේ පවුල්වල ජීවිත වැඩිදියුණු කරන අන්දමින් ජීවත්වීමට සැබැවින්ම වුවමනා කරන ප්‍රජාතන්ත්‍රවාදී රජයන් සමගින් වැඩකිරීම තමන්ගේ ජනතාවගේ සුබසෙත තකා වැදගත්වන බව අවබෝධකරගත් රටවල් වනවා. ඉන්දියාව, ජපානය හා දකුණු කොරියාව සමගින් පමණක් නොවෙයි, එක්සත් ජනපදය සමගිනුත් ශ්‍රී ලංකාවට එක්ව වැඩකළ හැකි දේවල් මේවායි. අප ශ්‍රී ලංකාවේ ජනතාවට හොඳ ප්‍රතිඵල ලබාදෙනවා.

**ප්‍රශ්නය:** ඔව්, ඒවාගේම, එම්සීසී සහ ආරක්ෂක ගිවිසුම් කියන්නේ මෙරට ඉතාමත් උණුසුම් මාතෘකා. ඔබේ සංචාරයේ අරමුණ මේ කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට බලපෑමක් එල්ල කිරීම වන බවක්  අනුමාන කරමින් මාධ්‍ය වාර්තා පලවී තිබුණා. මේ පිළිබඳ ඔබතුමාගේ අදහස?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔව්, ඇත්තෙන්ම අද උදෑසන මා ශ්‍රී ලංකාවේ පුවත්පත් කියවුවා. ඒවායේ මෙම සංචාරයේ අරමුණ බොහෝදුරට වැරදියටයි අනුමාන කර තිබුණේ. බලන්න, මේ එම්සීසී කියන්නේ අප ලබාදීමට ඉදිරිපත්වන දේවල් අතරින් එක් පැතිකඩක් පමණයි. ශ්‍රී ලංකාවේ ජනතාවට එය අවශ්‍ය නම්, එය ඉතා හොඳයි. ඔවුන් වෙනත් මාර්ගයක් තෝරාගන්නේ නම්, එය ද කිසිසේත්ම ප්‍රශ්නයක් නොවේ. අපගේ හවුල්කාරීත්වය වැදගත් කිරීමටත් අප එක් එක් රට මෙම කළාපයේ වැදගත් රටවල් බවට පත් කරමින් අප එතරම්ම ළඟින් බෙදාහදාගන්නා ඒ පොදු ප්‍රජාතන්තවාදී දැක්ම සාක්ෂාත් කරගන්නටත් අපට එක්ව වැඩකළ හැකි බොහෝ දේවල් තිබෙනවා.

**ප්‍රශ්නය:** ඔව්, දැන් ඔබ ශ්‍රී ලංකාවේ නායකයින් සමගින් සාකච්ඡා පවත්වා තිබෙනවා. අප අතරේ දීර්ඝ කාලයක සිට පවතින ද්වීපාර්ශවීය සබඳතා තවදුරටත් පුළුල් කිරීම සඳහා, විශේෂයෙන්ම බොහෝ ආර්ථික ප්‍රශ්නවලට තුඩු දී ඇති මේ වසංගත කාලය තුළ අපට ඇති අළුත් විකල්ප මොනවාද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔව්, ඇත්තෙන්ම ඒ බව සත්‍යයි. චීනයේ වුහාන් නගරයෙන් ආ මෙම වෛරසය හරහා ඇතිව තිබෙන අභියෝගය ලෝකයේ මා සංචාරය කරන සෑම ස්ථානයකම සියළුදෙනාට බලපා තිබෙනවා. කිසිදු රටකට මේ ප්‍රශ්න මාලාවෙන් ගැලවෙන්නට හැකිවී නැහැ. පැහැදිලිවම සෞඛ්‍ය ගැටළුව හා බැඳුනු ප්‍රශ්න මාලාවක් තිබෙනවා, නමුත් අති විශාල ආර්ථික ගැටළු ද මෙහි තිබෙනවා. සංචාරක කර්මාන්තය මින් බරපතළ අන්දමින් බලපෑමට ලක්වී තිබෙනවා. මෙය, ලෝකයේ බොහෝ තැන්වල එසේයි.

මේ සම්බන්ධයෙන් අපේ මෙහෙවර මාලාව ඉතාමත් පැහැදිලියි: වෛරසය ආමන්ත්‍රණය කිරීමට අපගේ උපරිමයෙන් ක්‍රියා කිරීම, අප  ආරක්ෂා වන බව සහතික කරගැනීම, හොඳ උපකාර භාරගැනීම, මේ සඳහා චිකිත්සා සෙවීම, අපගේ රටතුළ නිවැරදි දෙය කිරීම හා ලෝකය වටා අනෙකුන්ට උපකාර කිරීම, සහ අපට හැකිතාක් වේගයෙන් එන්නතක් සොයාගැනීමට කටයුතු කිරීම. අප ඊට ළං වෙමින් සිටිනවා. අවසානයේ අප එය සාක්ෂාත් කරගනිවී කියා මට විශ්වාසයි. අප එසේ කළ පසු, මේ රෝගයෙන් මිය යාමේ අවදානම අඩු කරගැනීමට හැකි වේවි. ඒ වාගේම දුෂ්කර සහ වැදගත් කාර්යයක් වන අපගේ ආර්ථික නැවතත් ඉදිරියට ගෙනයාම ආරම්භ කරන්නට හැකිවේවි.

මාගේ සංචාරයට හේතුව පිළිබඳව මුල් අවස්ථාවේ ඔබ මගෙන් අසා සිටියා. ශ්‍රී ලංකාවට අපි ඩොලර් මිලියන 6ක පමණ කෝවිඩ් ආධාර ලබා දුන්නා. අප එය කළේ සතුටින්. නමුත් අවසානයේදී එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් කරනු ඇති හොඳම දේ වන්නේ වැඩි වැඩියෙන් ඇමරිකානු ව්‍යාපාර මෙරටට එන්නට සැලැස්වීම බව මට විශ්වාසයි. අපි අපනයන සථානයක් ලබාදෙනවා. ශ්‍රී ලංකාවේ අපනයන යවන විශාලතම ස්ථානය අපේ රටයි. ශ්‍රී ලංකා ජනතාවගෙන් භාණ්ඩ මිලදී ගනිමින්, එනම් භාණ්ඩ රාශියක් මිලදී ගනිමින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවිත වඩාත් යහපත් කරන්නට හැකිවීම පිළිබඳ අපි ආඩම්බර වනවා.

මෙහි සිදුකරන ඇමරිකානු ආයෝජන හරහා ද ජීවිත වැඩිදියුණු කරන්නට හැකි බව අපට විශ්වාසයි. අප පැමිණෙන විට, අප ශ්‍රී ලාංකිකයින් සේවයට බඳවා ගන්නවා, ශ්‍රී ලාංකිකයින් පුහුණු කරනවා, යහපත් ව්‍යාපාර පරිචයන්ට අනුකූල අන්දමින් අප එම ප්‍රජාවන්ට අත දෙනවා. මෙය, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර ආකෘතියක්, ඒවාගෙම එය අපට පොදු ආකෘතියක් වනවා. චීන රජය පැමිණෙන්නේ මෙම ආකෘතිය රැගෙන නොවේ. ඔවුන්,  ඔවුන්ගේ රජයට හිමි ව්‍යාපාර සමගින් පැමිණි කල, දැඩි හස්තයක් හා බර කොකුවක් සහිත එය පෙනෙන හා හැඟෙන අන්දම ඉතාමත් වෙනස්. අපේ නිගමනය නම් එය, ශ්‍රී ලංකා ජනතාවගේ යහපත තකා සිදුවන දෙයක් නොවේ යන්නයි. ඇමරිකානුවන් මෙහි පැමිණෙන විට, එතුළින් ශ්‍රී ලංකා ජනතාව කරා යහපත් දෑ ගලාඑනු ඇතැයි අපට විශ්වාස අතර අපට සැබැවින්ම මෙහි සිටීමට අවශ්‍ය වනවා.  අපට, හොඳ මිතුරකු හා හවුල්කරුවකු වීමට අවශ්‍ය වනවා.

ශ්‍රී ලංකාව තමන්ගේ කොටස ඉටු කළ යුතුයි. මෙරට, එවැනි ආයෝජන සඳහා ආරාධනා කරන ස්ථානයක් විය යුතුයි. අද උදෑසන ඉතාමත් දිරිගන්වනසුළු වූවා. ජනාධිපතිතුමාටත් මෙය හොඳින් වැටහෙන බව මා දන්නවා. පුනර්ජනනීය බලශක්තිය සඳහා අදහස් සහ කෘෂිකර්මාන්තය යනාදිය සඳහා සහය ලබාදීම තුළින්, ඇත්තෙන්ම ඒ අන්දමේ තිරසාර ආධාර අවශ්‍ය කර තිබුණු ඇතැම් ප්‍රදේශවල සංවර්ධනය ඇතිකිරීම සඳහා හැකියාව තිබේදැයි අප විසින් සලකාබැලීම එතුමාට අවශ්‍යයි.

**ප්‍රශ්නය:** ඉතින් අවසාන වශයෙන්, ඉතාමත් කෙටියෙන්, ශ්‍රී ලාංකිකයින්ට ඔබතුමා දෙන පණිවිඩය කුමක්ද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඒ පණිවිඩය මෙසේයි, එක්සත් ජනපදය කියන්නේ තවත් ප්‍රජාතන්ත්‍රවාදී රටක්. අප දැන් වසර 72ක පටන් මිතුරන් වී සිටිනවා.ඉදිරියටත් එය එසේ වේවි යැයි මා අපේක්ෂා කරනවා, ඒ වාගේම, ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවිත වඩාත් යහපත් කිරීමේ හොඳ කොටස්කරුවකු වීමට අපට අවශ්‍යයි.

**ප්‍රශ්නය:** අප සමගින් සම්බන්ධවීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතියි පොම්පෙඕ ලෙකම්තුමනි-

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔව් මහත්මයා

**ප්‍රශ්නය:** ඒ වාගෙම අපි ඔබතුමාට සුභ පතනවා

**පොම්පෙඕ ලේකම්තුමා:** බොහොම ස්තුතියි මහත්මයා, ඔබට ස්තුතියි

**ප්‍රශ්නය:** ස්තුතියි